# (49) ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය

## ප්‍රශ්න පත්‍ර ව්‍යුහය

**I පත්‍රය -** **කාලය : පැය 02යි.**

වරණ 5 බැගින් වූ බහුවරණ ප්‍රශ්න **50කි**. ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු **01** බැගින් **මුළු ලකුණු 50කි.**

**II පත්‍රය -** **කාලය : පැය 03යි.** (ඊට අමතරව කියවීම් කාලය මිනිත්තු 10 යි.)

මෙම ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් **දෙකකින්** සමන්විත වේ.

I කොටස - අර්ධ ව්‍යුහගත ප්‍රශ්න **තුනකි.** ප්‍රශ්න **දෙකකට** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 40කි.

II කොටස - රචනා වර්ගයේ ප්‍රශ්න **පහකි.** ප්‍රශ්න **තුනකට** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 60කි.

II පත්‍රය සඳහා මුළු ලකුණු = 100

| | | | | |
|---|---|---|---|---|
| අවසාන ලකුණ ගණනය කිරීම : | I පත්‍රය | | | = 50 |
| | II පත්‍රය | = | 100 ÷ 2 | = 50 |
| | අවසාන ලකුණ | | | = 100 |

### I පත්‍රය

**සැලකිය යුතුයි :**

* **සියලු ම** ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

* **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.(විභාගයේ දී පිළිතුරු සැපයීම සඳහා බහුවරණ කඩදාසියක් සපයනු ලැබේ)

---

**1.** සංස්කෘතිය නමින් හඳුන්වනුයේ,

(1) සදාචාරාත්මක ජීවිතයක් ගත කිරීම යි.

(2) සමාජයක සිරිත් විරිත් සහ සම්ප්‍රදායන් සමූහයේ එකතුව යි.

(3) එක් මානව යුගයකින් තවත් යුගයක් කරා ගමන් කිරීම යි.

(4) එක් මානව සමාජයකින් තවත් සමාජයන් වෙන්කොට හඳුනා ගැනීමේ සාධකය යි.

(5) සමාජයේ පරිපාලන ක්‍රියාවලිය යි.

**2.** ජුදා සංස්කෘතිය බිහිවීමෙහිලා ආභාසය ලැබූ පැරණි සංස්කෘතීන් වන්නේ,

(1) මෙසපොතේමියානු, අසිරියානු, හා බැබිලෝනියානු සංස්කෘතීන් ය.

(2) මෙසපොතේමියානු, රෝම හා ඉන්දියානු සංස්කෘතීන් ය.

(3) අසිරියානු, බැබිලෝනියානු හා ලතින් ඇමරිකානු සංස්කෘතීන් ය.

(4) ග්‍රීක, රොම හා ඉන්දියානු සංස්කෘතීන් ය.

(5) මෙසපොතේමියානු, රෝම හා අසිරියානු සංස්කෘතීන් ය.

**3.** පාලන අධිකාරිය දෙවියන්වහන්සේ ලැබුණු ත්‍යාගයක් බවට විශ්වාස කළ ජාතියක් වන්නේ,

(1) රෝමවරුන් ය. (2) චීන ජාතිකයෝ ය. (3) මිසර ජාතිකයෝ ය.

(4) පර්සියන්වරුන් ය. (5) ග්‍රීක ජාතිකයෝ ය.

4. පලස්තීන කඳුවැටිය සෑදී ඇති කොටස් හතර ලෙස සැලකෙන්නේ,

(1) ගලීලය, ජුදයාව, සමාරිය, නෙහෙබ් ය.
(2) ගලීලය, ජුදයාව, කානන්, නෙහෙබ් ය.
(3) ජුදයාව, පිලිස්තිය, සමාරිය, කානන්ය.
(4) ගලීලය, සමාරිය, ජුදයාව, නෙහෙබ් ය.
(5) සමාරිය, පිලිස්තිය, මොවාබ්, එදොම් ය.

5. පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.

A - දාවිත් රජ සමයේ පලස්තීනය සහ සිරියාව එක් කරමින් ශක්තිමත් රාජ්‍යයක් ගොඩ නැගීමට හැකි විය.
B - දාවිත් රජ සමයේ දී ගිවිසුම් කරඬුව ජෙරුසලමට ගෙන එන ලදී.
C - දාවිත් රජ සමයේ ජෙරුසලමේ දේව මාලිගාවක් ගොඩනැගී ය.
D - ගෝත්‍රික පාලනය අවසන් කරමින් ජෙරුසලම අගනුවරක් බවට පත් කරන ලදී.
E - දාවිත් රජ සමයේ සිටි ප්‍රධාන පූජකතුමා සහ දිවැසිවරයා සාමුවෙල් ය.

ඉහත ප්‍රකාශ අතරින් දාවිත් රජ පිළිබඳ නිවැරදි වන්නේ,

(1) A, B හා C ය.
(2) A, B හා D ය.
(3) A, D හා E ය.
(4) B, C හා D ය.
(5) B, D හා E ය.

6. උතුරු රාජ්‍යය සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශ අතරින් වැරදි ප්‍රකාශය වන්නේ,

(1) ක්‍රි.පූ 922 දී ජෙරබොවාම් උතුරු රාජ්‍යයේ රජබවට පත් විය.
(2) එලියා දිවැසිවරයා විසින් බාල් නමස්කාරය හෙලා දැක සැබෑ දේව නමස්කාරය නැවත පිහිට වීය.
(3) අහසියා රජගේ කාලයේ දී එලියා දිවැසිවරයාගේ සේවය සිදු විය.
(4) එලිසා, මිකා, ආමොස් සහ හොසියා යන දිවැසිවරු උතුරු රාජ්‍යයෙහි සේවය කළහ.
(5) උතුරු රාජ්‍යයෙහි වැසියෝ ජෙරුසලමෙහි තම වන්දනා කටයුතු සිදු කළහ.

7. පලස්තීනයේ ග්‍රීක පාලනය සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය වන්නේ,

(1) පලස්තීනයේ බොහෝ නගරවල නාම ග්‍රීක නාම බවට පත් වූයේ ය.
(2) ජුදෙව්වරුන් විසින් ග්‍රීක වෛද්‍ය ක්‍රම අනුගමනය කරන ලදී.
(3) පලස්තීනය තුළ ග්‍රීක ක්‍රීඩාංගණ වැනි ගොඩනැගිලි ඇති විය.
(4) බොහෝ ජුදෙව්වරු පලස්තීනය අතහැර ග්‍රීසියෙහි පදිංචියට ගියහ.
(5) ග්‍රීක පාලනය හේතුවෙන් පලස්තීනයේ දේශපාලන හා ආගමික බලය උත්තම පූජකයන් අතට පත් විය.

8. පහත සඳහන් මංගල්‍යය අතරින් පැරණි ම කිතුනු මංගල්‍යය දෙක වන්නේ,

(1) පාස්කුව හා පෙන්තකොස්ත (ශුද්ධාත්ම) මංගල්‍යය යි.
(2) පාස්කුව හා නත්තල් මංගල්‍යය යි.
(3) පෙන්තකොස්ත මංගල්‍ය හා නත්තල් මංගල්‍ය යි.
(4) නත්තල් මංගල්‍යය හා අහස්නැගීමේ මංගල්‍යය යි.
(5) අහස් නැගීමේ මංගල්‍යය සහ පාස්කු මංගල්‍යය යි.

9. මුල් අවධියේ තාපස ජීවිතයේ දක්නට ලැබුණ ලක්ෂණ අතරින් ප්‍රධාන ලක්ෂණ තුනක් වන්නේ,

(1) නිශ්ශබ්දතාවය, නිරාහාරශීලය, වැඩ කිරීම ය.
(2) නිශ්ශබ්දතාවය, යාච්ඤා කිරීම, පොදු ජීවිතය ය.
(3) නිශ්ශබ්දතාවය, යාච්ඤාව, නිරාහාරශීලය ය.
(4) යාච්ඤාව, වැඩ කිරීම, පොදු ජීවිතය ය.
(5) භාවනාව, වැඩ කිරීම, පොදු ජීවිතය ය.

10. බෙනඩික්ත (පංතිය) නිකාය ආදේශ කොට ගනිමින් එම පැවිදි නීතිය අනුව බිහි වූ තවත් පැවිදි පන්තියක් වන්නේ,

(1) ශිෂ්ටශියන් ය.
(2) ට්‍රැපිස්ට්ස් ය.
(3) කාර්මෙල් ය.
(4) වින්සෙන්ටියන් ය.
(5) කැපුචින් ය.

**11.** මුල් ක්‍රිස්තියානි සමූහය තුළ දක්නට ලැබුණ ලක්ෂණ තුනක් වන්නේ වන්නේ,

(1) එක්සත්කම, නිරාහාරශීලය, යාචඥාව ය. (2) එක්සත්කම, නිරාහාරශීලය, බෙදාගැනීම ය.

(3) එක්සත්කම, බෙදාගැනීම, වන්දනා ගමන් යෑම ය. (4) එක්සත්කම, නිරාහාරශීලය, වන්දනා ගමන් යෑම ය.

(5) එක්සත්කම, යාචඥාව, බෙදාගැනීම ය.

**12.** සෙසරියාවේ ශතාධිපතියා වන කොර්නේලියසර්ගේ සිත් හැරීම,

(1) ජුදා ජාතියේ කෝපයට හේතු විය.

(2) ජුදා සහ අන්‍යජාතික ක්‍රිස්තියානින් අතර මතගැටුමකට හේතු විය.

(3) බොහෝ අන්‍ය ජාතිකයන්ගේ සිත් හැරීමට හේතු විය.

(4) සාවුල් විසින් ක්‍රිස්තියානීන් කෙරෙහි සැක පහළ කිරීමට හේතුවක් විය.

(5) රෝම ජාතිකයන් ක්‍රිස්තියානීන් කෙරෙහි සැක පහළ කිරීමට හේතුවක් විය.

**13.** ජෙරුසලමේ මන්ත්‍රණ සභාව පැවැත්වීමට මූලික හේතුව වූයේ,

(1) අන්‍ය ජාතිකයනට කිතු දහම දේශනා කළ යුතුය යන ප්‍රශ්නය යි.

(2) කිතු දහම වැළඳගත් අන්‍ය ජාතිකයන් චර්මඡේදනය කළ යුතුද යන ප්‍රශ්නය යි.

(3) ශුභාරංචිය දේශනා කිරීමේ දී පළමුව එය ජුදා ජාතිකයන්ට කළ යුතු ද යන ප්‍රශ්නය යි.

(4) ග්‍රීක ජාතික වැන්දඹුවනට දයාවේ කටයුතු ඉටුනොවීම සම්බන්ධයෙන් පැන නැගුණු ප්‍රශ්නය යි.

(5) බර්නබාස්තුමන් හා පාවුලුතුමන් අතර ඇති වූ මත ගැටුමකි.

**14.** ශුද්ධ වූ පාවුලුතුමන්ගේ සිත්හැරීම සිදු වූයේ,

(1) සමාරියට යන අතරතුර ය. (2) ඩැමැස්කයට යන අතරතුර ය.

(3) ජෙරුසලමට යන අතරතුර ය. (4) ඒපීසියට යන අතරතුර ය.

(5) පිලිප්පියේ ධර්ම ශාලාවකදී ය.

**15.** තෙයියාර් ඩි ෂාර්ඩැන් පියතුමා පිළිබඳව **නොගැළපෙන** වගන්තිය වන්නේ,

(1) එතුමා ජේසු නිකායික පියතුමෙකි.

(2) එතුමා පාෂාණ භූත විද්‍යාඥයෙක් සහ භූ විද්‍යාඥයකි.

(3) එතුමා ප්‍රසිද්ධ සාහිත්‍යධරයෙකි.

(4) එතුමා පීකින් මානවයා සොයා ගත් කණ්ඩායමේ එක් අයෙකු වූයේ ය.

(5) ක්‍රිස්තුන් වහන්සේ තුළ ඉතිහාසයේ පූර්ණත්වය සිදුවන බව එනම් ඔමේගා ලක්ෂ්‍යය පිළිබඳව ලිවීය.

**16.** පහත සඳහන් වගන්ති අතරින් ඇල්බට් අයින්ස්ටයින් පිළිබඳව නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) අයින්ස්ටයින් සාපේක්ෂතාවාදය පිළිබඳ සිද්ධාන්තය සොයා ගත්තේ ය.

(2) අයින්ස්ටයින් අදේවවාදියෙකි.

(3) අයින්ස්ටයින් විශ්වාසය පිළිබඳ ගැටලුවකට මුහුණ දෙන ලදී.

(4) අයින්ස්ටයින් භෞතික විද්‍යාඥයෙකු නොවේ.

(5) අයින්ස්ටයින් ගුරුත්වාකර්ෂණය පිළිබඳව සොයා ගන්නා ලදී.

**17.** ශුද්ධ වූ අගුස්තිනුතුමන් පිළිබඳ ව නිවැරදි ප්‍රකාශ තෝරන්න.

A - කිතුණු සභා ඉතිහාසයේ ශ්‍රෙෂ්ඨතම ලතින් සභා පියා ය.

B - පාප උච්චාරණය නමැති ග්‍රන්ථය එතුමන් ලියූ ග්‍රන්ථ අතර ශ්‍රෙෂ්ඨතම ග්‍රන්ථයකි.

C - එතුමන් කලක් මැනිකිවාදය පිළිගෙන සිටියේ ය.

D - ශාන්ත ජෙරොම්තුමා එතුමන්ගේ ගුරුවරයා වූයේ ය.

E - එතුමන් ඇරිස්ටෝටල්ගේ දර්ශනය ගුරුකොට ගත්තේ ය.

(1) A , B හා C ය. (2) A, B හා D ය. (3) A, C හා D ය.

(4) B, C හා D ය. (5) B, C හා E ය.

**18.** පහත සඳහන් ප්‍රකාශ අතරින් ශුද්ධ වූ තෝමස් ඇක්වයිනස්තුමන් පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) එතුමන් දොමිනිකාන නිකායික පියතුමෙකි, දේව ධර්ම චින්තකයෙකි, සහා ඉතිහාසය පිළිබඳ විශාරදයෙකි.

(2) දේව ධර්ම චින්තකයෙකි, ස්කොලැස්ටික් නමැති ක්‍රම වේදය අනුගමනය කළ අයෙකි, ඉතිහාසය පිළිබඳ විශාරදයෙකි.

(3) දොමිනිකාන පියතුමෙකි, ප්ලේටෝගේ අර්ශනය අනුගමනය කළ අයෙකි, දේව ධර්ම චින්තකයෙකි.

(4) දේවධර්ම චින්තකයෙකි, ස්කොලැස්ටික් ක්‍රමවේදය අනුගමනය කළ අයෙකි, දොමිනිකාන පියතුමෙකි.

(5) දොමිනිකාන පියතුමෙකි, සහා ඉතිහාසය පිළිබඳ විශාරදයෙකි, ප්ලේටෝගේ දර්ශනය අනුගමනය කළ අයෙකි.

**19.** පහත සඳහන් ප්‍රකාශ අතරින්  යුප්‍රටීස් - ටයිග්‍රිස් ගංගා නිම්න ශිෂ්ටාචාරය පිළිබඳව නිවැරදි ප්‍රකාශ වන්නේ,

A - නූතන ඉරාකය පුරාණයේ දී මෙසපොතේමියාව යනුවෙන් හඳුන්වන ලදී.

B - ගණිතය, වෛද්‍ය විද්‍යාව සහ ජ්‍යොතිශය මෙම ප්‍රදේශය තුළ වැඩි වර්ධනය විය.

C - මෙසපොතේමියාවේ පාලකයා විසින් මුළු ප්‍රදේශයම පාලනය කරන ලදී.

D - මෙම ප්‍රදේශයේ මූලික ජීවන මාර්ගය වූයේ කෘෂිකර්මය හා සත්ත්ව පාලනය යි.

E - මහා ඇලෙක්සැන්ඩර් රජතුමා කලක් මෙම ප්‍රදේශයෙහි පාලකයාව සිටියේ ය.

(1) A, B හා D ය.　(2) A, C හා D ය.　(3) B, C හා D ය.

(4) B , D හා E ය.　(5) C, D හා E ය.

**20.** පවුල් ජීවිතය හා සම්බන්ධව ශුද්ධ වූ පාවුළුතුමන්ගේ ඉගැන්වීම් තුනක් අඩංගු වන ප්‍රකාශය තෝරන්න.

(1) ස්වාමි පුරුෂයා සහ භාර්යාව අතර සම්බන්ධ ක්‍රිස්තුන් වහන්සේ සහ සභාව අතර සම්බන්ධයට සමාන ය, ක්‍රිස්තුන් වහන්සේ සභාවට ප්‍රේම කළාක් මෙන් ස්වාමි පුරුෂයා තම භාර්යාවට ප්‍රේම කළ යුතු ය, භාර්යාව සෑම කාර්‍යයේදී ම ස්වාමිපුරුෂයාට යටත් විය යුතු ය.

(2) ස්වාමි පුරුෂයා සහ භාර්යාව අතර සම්බන්ධ ක්‍රිස්තුන් වහන්සේ සහ සභාව අතර සම්බන්ධයට සමාන ය, ක්‍රිස්තුන් වහන්සේ තුළ ජීවත් වීමේ දී ස්ත්‍රී පුරුෂ භේදයක් නැත. තම භාර්යාව දික්කසාද කිරීමේ අයිතිය ස්වාමි පුරුෂයාට හිමි වේ.

(3) ක්‍රිස්තුන් වහන්සේ සභාවට ප්‍රේම කළාක් මෙන් ස්වාමි පුරුෂයා තම භාර්යාවට ප්‍රේම කළ යුතු ය, ක්‍රිස්තුන් වහන්සේ සභාවේ හිස වනන්නාක් මෙන් ස්වාමි පුරුෂයා භාර්යාවගේ හිසය, පුරුෂයා හා ස්ත්‍රිය එකිනෙකට සමාන නැත.

(4) ස්වාමි පුරුෂයා සහ භාර්යාව අතර සම්බන්ධ ක්‍රිස්තුන් වහන්සේ සහ සභාව අතර සම්බන්ධයට සමානය ක්‍රිස්තුන් වහන්සේ සභාවට ප්‍රේම කළාක් මෙන් ස්වාමි පුරුෂයා භාර්යාවට ප්‍රේම කළ යුතු ය, ක්‍රිස්තුන්වහන්සේගේ  සභාවේ හිස වන්නාක් මෙන් ස්වාමි පුරුෂයා භාරයාවගේ හිස ය.

(5) ස්වාමි පුරුෂයා සහ භාර්යාව අතර සම්බන්ධය ක්‍රිස්තුන් වහන්සේ සහ සභාව අතර සම්බන්ධයට සමාන ය, ක්‍රිස්තුන් වහන්සේ සභාවේ හිස වනන්නාක් මෙන් ස්වාමි පුරුෂයා භාර්යාවගේ හිස ය, පුරුෂයා හා එක සමාන නොවේ.

**21.** මෙසපොතේමියාව සම්බන්ධයෙන් පහත ප්‍රකාශ සලකා බලන්න.

A - මෙසපොතේමියාවේ ප්‍රධාන ජීවන මාර්ග කෘෂිකර්මය සහ සත්ත්ව පාලනය යි.

B - සිහින අර්ථ නිරූපනය කිරීමේ පුරුද්දක් මෙහි ජනයා අතර තිබිණි.

C - පළමුවෙන් කාසි භාවිත කළේ මෙහි ජනයා විසිනි.

D - ග්‍රන්ථකරණය සඳහා මෙහි ජනයා පැපිරස් භාවිතා කරන ලදී.

E - ඔවුන් විසින් අත්තික්කා ගෙඩි බෙහෙත් සඳහා භාවිතා කරන ලදී.

ඉහත ප්‍රකාශ ඇසුරෙන් මෙසපොතේමියාව සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ වන්නේ,

(1) A , B හා C ය.　(2) A, B හා D ය.　(3) A, C හා D ය.

(4) B ,C හා D ය.　(5) C, D හා E ය.

**22.** හෙලනිකවාදය යනුවෙන් හැඳින්වෙන්නේ,

(1) ග්‍රීක සහ නැගෙනහිර ආසියානු ශිෂ්ටාචාරයන්ගේ එකතුවකි.

(2) ග්‍රීක සහ මෙසපොතේමියානු ශිෂ්ටාචාරයන්ගේ එකතුවකි.

(3) ග්‍රීක සහ නයිල් ගංගා නිම්න ශිෂ්ටාචාරයන්ගේ එකතුවකි.

(4) ග්‍රීක සහ රෝම ශිෂ්ටාචාරයන්ගේ එකතුවකි.

(5) මෙසපොතේමියාව සහ නයිල් ගංගා නිම්න ශිෂ්ටාචාරයන්ගේ එකතුවකි.

**23.** දෙසැම්බර් මස 25 වන දිනට නත්තල් මංගල්‍යය පැවැත්වීමේ සිරිත ආරම්භ කළ වර්ෂය වන්නේ,

(1) ක්‍රි.ව. 6 දී ය. (2) ක්‍රි.ව. 33 දී ය. (3) ක්‍රි.ව. 325 දී ය.

(4) ක්‍රි.ව. 366 දී ය. (5) ක්‍රි.ව. 1054 දී ය.

**24.** පෙන්තකොස්ත මංගල්‍යය (ශුද්ධාත්ම මංගල්‍යය) පැවැත්වූයේ,

(1) පාස්කුවට දින හතළිහකට පසුව ය.

(2) පාස්කුවට දින හතළිස් පහකට පසුව ය.

(3) පාස්කුවට දින හතළිස් නමයකට පසුව ය.

(4) පාස්කුවට දින පනහකට පසුව ය.

(5) පාස්කුවට දින හැටකට පසුව ය.

**25.** ජර්මනියේ අපෝස්තුලුවරයා ලෙස හැඳින්වූයේ,

(1) ශාන්ත කොලොම්බන් තුමා ය. (2) ශාන්ත පැට්රික් තුමා ය.

(3) ශාන්ත බොනිපස් තුමා ය. (4) ශාන්ත බෙනඩික් තුමා ය.

(5) ශාන්ත බැසිල් තුමා ය.

**26.** ජෙරුසලම් මන්ත්‍රණ සභාවේ දී ගනු ලැබූ තීරණයක් **නොවන්නේ**,

(1) දේව රූපවලට ඔප්පුකරන ලද ආහාර අනුභව නොකිරීම යි.

(2) අන්‍ය ජාතිකයන් සමඟ එක්ව ආහාර නොගැනීම යි.

(3) බොටුව මිරිකා මරන ලද සතුන්ගේ මස් අනුභව නොකිරීම යි.

(4) බොටුව මිරිකා සතුන්ගේ මස් අනුභව නොකිරීම යි.

(5) තහනම් විවාහ සම්බන්ධතාවලට ඇතුළත් නොවීම යි.

**27.** පහත සඳහන් ග්‍රන්ථ ගැන සලකා බලන්න.

A - ශාන්තුවරුන්ගේ චරිත කතා (The Life of Smintf)

B - ක්‍රිස්තු අනුසාරය (Immidention of Christ)

C - පදනම (Foundation)

D - අධ්‍යාත්මික ගීතය (Spiritral Canticle)

E - ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිත කථාව (The Life of Christ )

ඉහත සඳහන් ග්‍රන්ථ අතරින් ශුද්ධ වූ ඉග්නේෂියස් ලොසෙලාතුමන්ගේ ජීවිතයට බලපෑ ග්‍රන්ථ වන්නේ,

(1) A සහ B ය. (2) A සහ E ය. (3) B සහ C ය.

(4) C සහ D ය. (5) D සහ E ය.

**28.** මහා චාල්ස් අධිරාජයා (චාල්මේන්) විසින් රදගුරුතුමන්ලාට ඉටු කිරීමට නියම කළේ,

(1) වයිකින් හමුදාවන් අල්ලා ගැනීම යි.

(2) ආසන දේව මන්දිර ආශ්‍රිතව පාසල් ගොඩනැගීම යි.

(3) යුරෝපීය ගෝත්‍රයන් කිතු දහමට හැරවීම යි.

(4) කුලීන හා ධනවත් පවුල්වල ළමුන්ට උසස් අධ්‍යාපනයක් ලබා දීම යි.

(5) ප්‍රජා ප්‍රසාදිතුමන්ලාව ගුරුවරුන් වශයෙන් පත් කිරීම යි.

**29.** අහිමි වූ පරාදීසය (Pradise Lost) නැමැති ග්‍රන්ථය රචනා කරන ලද්දේ,

(1) ජෝන් බැන්යන් විසිනි. (2) සර්වානෝ තෝමස් විසිනි.
(3) ජෝන් මිල්ටන් විසිනි (4) ඩාන්වේ අලගියේරේ විසිනි.
(5) තෝමස් කම්පිස් විසිනි.

**30.** මන්නාරමේ වැසියන් ප්‍රාණ පරිත්‍යාගීන් බවට පත් වූ වර්ෂය වන්නේ,

(1) ක්‍රි.ව. 1520 දී ය. (2) ක්‍රි.ව. 1544 දී ය. (3) ක්‍රි.ව. 1560 දී ය.
(4) ක්‍රි.ව. 1564 දී ය. (5) ක්‍රි.ව. 1568 දී ය.

**31.** පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.

A - මයිකල් ආන්ජලෝ ප්‍රසිද්ධ සිත්තරෙකු හා මූර්ති ශිල්පියෙකි.
B - ඔහු සිස්ටයින් දේව මන්දිරයේදී වහලෙහි (සීලිමෙහි) ලෝකය මැවීමේ සිද්ධිය සිතුවම් කරන ලදී.
C - ආසනගත දේවමාතාවෝ (මැඩෝනා) ඔහුගේ විශිෂ්ට නිර්මාණයකි.
D - ඔහු විසින් ''අවසාන විනිශ්චය'' සිතුවම් ගත කරන ලදී.
E - ඔහු ''දේව සිත්තරා'' යන නමින් හඳුන්වන ලදී.

ඉහත ප්‍රකාශ අතරින් මයිකල් ආන්ජලෝ පිළිබඳ නිවැරදි ප්‍රකාශ වන්නේ,

(1) A, B හා C ය. (2) A, B හා D ය. (3) A, D හා E ය.
(4) B, C හා D ය. (5) C, D හා E ය.

**32.** පහත සඳහන් ප්‍රකාශ අතරින් පිලිප් බල්දේව්ස්තුමන් සම්බන්ධයෙන් **නොගැළපෙන** ප්‍රකාශය වන්නේ,

(1) එතුමාව හමුදා සේවය සඳහා ගාල්ලට යැවීම යි.
(2) යාපනය ප්‍රදේශයෙහි කැල්විනිස්ත වාදය ප්‍රචලිත කිරීමට එතුමා මහත් පරිශ්‍රමයක් දැරී ය.
(3) ආගම ප්‍රචාරය කිරීමේ ආධාරකයක් ලෙස එතුමා දේශීය භාෂාව ප්‍රගුණ කළේ ය.
(4) එතුමා දෙමළ භාෂාවෙන් බොහෝ පත්‍රිකා ලිවී ය.
(5) කොළරා රෝගය හේතු කොටගෙන එතුමා යාපනයේ දී මිය ගියේ ය.

**33.** ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය ගොඩ නැගීමෙහිලා සෘජුවම බලපෑ ශිෂ්ටාචාර මොනවාද ?

(1) සුමේරියන්, පර්සියන්, ඇසිරියන් (2) ජුදා, ග්‍රීක, රෝම
(3) ඇසිරියන්, බැබිලෝනියන්, කානා (4) ජුදා, පර්සියන්, සුමේරියන්
(5) රෝම, මෙසපොතේමියානු, ඇසිරියන්

**34.** වල්ගේට් යන්නෙහි අර්ථය වන්නේ,

(1) ශුද්ධ වූ බයිබලයේ ලතින් පරිවර්තනය යි.
(2) ග්‍රීක දර්ශනය පිළිබඳ ග්‍රන්ථය යි.
(3) ශුද්ධ වූ බයිබලයේ හිබෲ පිටපත යි.
(4) සභෘ පියවරුන් විසින් ලියූ ලිපිය යි.
(5) ශුද්ධ වූ බයිබලයේ ග්‍රීක පරිවර්තනය යි.

**35.** ග්‍රීක භාෂාවෙන් ලියවුණු ශුද්ධ වූ බයිබලීය ග්‍රන්ථ වන්නේ,

(1) උත්පත්ති පොත සහ නික්ම යාම යි.
(2) ප්‍රඥාවන්තයා සහ ශු.ලූක් සුබ අස්න යි.
(3) ආමොස් සහ යෙසායා යි.
(4) ද්විතීය නීති සංග්‍රහය සහ රෝමවරුන්ට ලියූ ලිපිය යි.
(5) යාකොබ් 1,2 සහ සලමොන්ගේ ගීතය යි.

**36.** පහත සඳහන් සම්බන්ධතා අතරින් **නොගැළපෙන** සම්බන්ධතා වන්නේ,

A - උගතුන්ගේ භාෂාව - ලතින්

B - ග්‍රීක දර්ශනය - ඥානවාදය

C - මෙසපොතේමියානු ශිෂ්ටාචාරය - ශිෂ්ටාචාරයේ තොටිල්ල

D - මැසරොටික් ග්‍රන්ථ (ලියවිලි) - ග්‍රීක බයිබලයේ ජුදා ග්‍රන්ථ

E - අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත - මතෙව්තුමා

(1) A, B සහ C ය. (2) A, D සහ E ය. (3) B, C සහ D ය.

(4) B, D සහ E ය. (5) C, D සහ E ය.

**37.** ජෙරුසලමේ රජ වංශයෙන් රෙහෝබොවාම් රජ විසින් පාලනය කරන ලද ගෝත්‍ර වන්නේ,

(1) රූබෙන් සහ ජුදෙයාව ය.

(2) දාන් සහ නෙප්තාලි ය.

(3) අෂර් සහ ලෙවි ය.

(4) ජුදෙයාව සහ බෙන්ජමින් ය.

(5) කාන් සහ බෙන්ජමින් ය.

**38.** පරිසිවරුන්ගේ සහ සදිසිවරුන්ගේ කණ්ඩායම් බිහි වුයේ,

(1) ක්‍රි.පු. 63 දී රෝම අධිරාජ්‍යයා වන නිරෝගේ සමයේ දී ය.

(2) ක්‍රි.පු. 200 දී ඊජිප්තියානු සෙන්පති ටොලමිගේ සමයේ දී ය.

(3) ක්‍රි.පු. 200 දී සිරියාවේ රජ වන 3වන අන්තියෝක් සමයේ දී ය.

(4) ක්‍රි.පු. 333 දී ග්‍රීක අධිරාජ්‍ය මහා ඇලෙක්සැන්ඩර්ගේ සමයේ දී ය.

(5) ක්‍රි.පු. 597 දී බැබිලෝනියාවේ රජ වන නබුකඩනසාර්ගේ සමයේ දී ය.

**39.** දාවිත් රජතුමන්ව අභිෂේක කරන ලද ස්ථානය වන්නේ,

(1) කපර්නාවුම් ය. (2) නෙහෙබ් ය. (3) නාසරෙත් ය.

(4) හොබ්රෝන් ය. (5) බෙතනි ය.

**40.** පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.

A - ලූතර්තුමාගේ අදහස් පිළි ගනිමින් ලූතර්ගෙන් ධර්මය වැළඳ ගත්තේ ය.

B - ප්‍රතිසංස්කරණ සභාවන්හි ප්‍රධාන ස්ථානය ලෙස ජිනීවා නගරය පත් කළේ ය.

C - දිව්‍ය සත්ප්‍රසාධ වහන්සේ තුළ ක්‍රිස්තුන් වහන්සේ වැඩ නොසිටින බවත් එය භෝජනයක් පමණක් බවත් ප්‍රකාශ කළේ ය.

D - දෙවියන් වහන්සේ විසින් පෙරදී තෝරා ගත් අය පමණක් ස්වර්ගයට යන බව පිළිගත්තේ ය.

E - ශුද්ධොත්තම පියතුමන්ගේ බලය කොන්දේසි සහිතව පිළිගත්තේ ය.

ඉහත සඳහන් ප්‍රකාශ අතරින් කැල්වින්තුමන් පිළිබඳ සත්‍ය ප්‍රකාශ වන්නේ,

(1) A, B හා C ය. (2) A, B හා D ය. (3) A ,C හා E ය.

(4) B, C හා D ය. (5) C, D හා E ය.

**41.** ජුදා විවාහ සිරිත් අතර දක්නට **නොලැබෙන** අංගය වන්නේ,

(1) විවාහයට පෙර විවාහ ගිවිසුම ඇති කර ගැනීම යි.

(2) මනාලියව පෙරහැරකින් නිවසට කැඳවාගෙන යාම යි.

(3) විවාහයට පැමිණෙන අයට විවාහ වස්ත්‍ර දීම යි.

(4) භාර්යාවන් දෙදෙනෙකු එකවර විවාහ කර ගැනීමට අවසර තිබීම යි.

(5) පුරුෂයාට පමණක් දික්කසාද වීමේ අවසරය තිබීම යි.

**42.** පහත සඳහන් ප්‍රකාශ අතරින් මතෙව් රිච්තුමන් පිළිබඳ **නොගැළපෙන** ප්‍රකාශය වන්නේ,

(1) එතුමා ඉතාලි ජාතික ජේසු නිකායික පියතුමෙකි.

(2) එතුමා ධර්මදූත සේවය සඳහා චීනයට පැමිණියේ ය.

(3) චීන ජාතිකයන් කිතු දහමට හරවා ගැනීම නිසා එතුමාව චීනයෙන් පිටුවහල් කළේ ය.

(4) එතුමා චීන භාෂාවෙන් ධර්මෝපදේශ ග්‍රන්ථයක් සම්පාදනය කළේ ය.

(5) එතුමා කොම්පියුසියන් ගුරුවරුන්ගේ ජීවිත ක්‍රමය අනුගමනය කළේ ය.

**43.** පහත සඳහන් ප්‍රකාශ අතුරින් එකිනෙකට **නොගැළපෙන** කොටස් ඇති ප්‍රකාශය තෝරන්න.

(1) සීරෝ මලබාර් සභාව - රෝමානු කතෝලික සමඟ සම්බන්ධව සිටී යි.

(2) සීරෝ මලන්කාර සභාව - අන්තියෝකියානු ජන වන්දනා පිළිවෙත් අනුගමනය කරයි.

(3) මාර් තෝමා සභාව - ඇන්ග්ලිකානු සභාව සමඟ ඉතා සමීප සම්බන්ධතාවයක් පවත්ව යි.

(4) රෝමානු කතෝලික සභාව - රෝමානු වන්දනා පිළිවෙත් අනුගමනය කිරීම යි.

(5) සීරෝ මලබා සීරෝ මලංකාර සභා - ශුද්ධෝත්තම පියතුමන්ට පක්ෂපාතීත්වය දක්වයි.

**44.** ජපානයේ කිතු දහම සම්බන්ධයෙන් පහත ප්‍රකාශ සලකා බලන්න.

A - ක්‍රි.ව. පස්වන සියවසේදී ජපානයේ නෙස්ටෝරියානු කිතු දහම තිබූ බව සඳහන් වෙයි.

B - ජපානයේ ප්‍රථමයෙන්ම කිතු දහම දේශනා කළේ ජේසු නිකායික පියවරුන් විසිනි.

C - ජපානය තුළ කිතු දහම පැතිර වීමට සැමවිට රාජානුග්‍රහය ලැබිණි.

D - ප්‍රොතෙස්තන්ත ධර්මදූතයන් විසින් ශුද්ධ වූ බයිබලය ජපන් භාෂාවට පරිවර්ථනය කරන ලදි.

E - ජපාන ජාතිකයන් අතරින් තුනෙන් එකක් පමණ කොටසක් කතු දහම අදහයි.

ඉහත ප්‍රකාශ අතරින් ජපානය පිළිබඳ නිවැරදි ප්‍රකාශ වන්නේ,

(1) A, B හා C ය. (2) A, B හා D ය. (3) B, C හා D ය.

(4) B, D හා E ය. (5) C, D හා E ය.

**45.** හයවන සියවසේ දී ශ්‍රී ලංකාවේ කිතුනුවන් සමූහයක් සිටි බව දැක්වෙන ග්‍රන්ථය රචනා කර ඇත්තේ,

(1) කොස්මොස් ඉන්ඩිපෙලෙක්ටුස් ය. (2) මාර්තෙන්ද පෝරෝ ය.

(3) කනාහි තෝමස් ය. (4) ඉපොෂ් අබ්සාකිබ් ය.

(5) පාහියන් භික්ෂුන්වහන්සේ ය.

**46.** පෘතුගීසීන් පළමුවරට ශ්‍රී ලංකාවට පැමිණියේ කවර නායකයාගේ නායකත්වය යටතේ ද?

(1) ක්‍රිස්ටෝපර් කොලොම්බස්

(2) වස්කෝද ගාමා

(3) ප්‍රැන්සිස්කෝද අල්මේදා

(4) ප්‍රැන්සිස්කෝ මැගලන්

(5) ලොරෙන්සෝ ද අල්මේදා

**47.** පහත සඳහන් ප්‍රකාශ අතරින් ප්‍රැන්සිස්කානු ධර්මදූතවරුන් සම්බන්ධයෙන් සත්‍ය ප්‍රකාශය වන්නේ,

A - ශ්‍රී ලංකාවට පළමුවෙන්ම පැමිණි ධර්මදූතවරුන් ය.

B - මෙම ධර්මදූතයන් ශ්‍රී ලංකාවට පැමිණියේ ධර්ම ප්‍රචාරය සඳහා ය.

C - මෙම ධර්මදූතවරු දේවස්ථාන අවට කුඩා පාසල් ආරම්භ කළහ.

D - කතෝලික ධර්මය වැළඳ ගැනීමට ප්‍රතික්ෂේප කළ අයට පාලකයන් ලවා දඬුවම් ලබා දුන්හ.

E - කතෝලික ධර්මය වැළඳගත් අයට යම් විශේෂ වරප්‍රසාද හිමි විය.

(1) A, B හා C ය. (2) A, C හා D ය. (3) A, C හා E ය.

(4) B, C හා D ය. (5) C, D හා E ය.

**48.** පෘතුගීසීන්ගේ පැමිණීමෙන් ශ්‍රී ලාංකික සමාජයට අත්වූ බලපෑම ගැන සඳහන් වන පහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය වන්නේ,

A - විවාහ ලියාපදිංචි කිරීමේ එනම් තෝම්බු ක්‍රමය ඇති විය.

B - සිංහල භාෂාවට බොහෝ අලුත් වචන රාශියක් එක් විය.

C - නූතන අධ්‍යාපන ක්‍රමය ආරම්භ විය.

D - ගෘහ නිර්මාණ ශිල්පයේ විශාල දියුණුවක් ඇති විය.

E - රට තුළ ආර්ථික වර්ධනයක් ඇති විය.

(1) A, B හා C ය. (2) A, B හා D ය. (3) B, C හා D ය.

(4) B, C හා E ය. (5) C, D හා E ය.

**49.** ගොන්සාල්වෙස් පියතුමන් පිළිබඳ වැරදි ප්‍රකාශය වන්නේ,

(1) ගොන්සාල්වෙස් පියතුමන් බ්‍රාහ්මණ වංශයට අයත් ගෝවානු ජාතික පියතුමෙකි.

(2) එතුමා ඔරතෝරියානු නිකායට බැඳී ශ්‍රී ලංකාවට පැමිණියේ ය.

(3) ගොන්සාල්වෙස් පියතුමාට සිංහල කිතුනු සාහිත්‍යයක් බිහි කිරීමට හැකි විය.

(4) ගොන්සාල්වෙස් පියතුමා දෙමළ භාෂාවෙන් ලියූ පොත් ගණන දෙකකි.

(5) ගොන්සාල්වෙස් පියතුමාගේ සිරුර බෝලවත්ත දේවස්ථානය තුළ මිහිදන් කරවා ඇත.

**50.** ඕලන්ද ජාතීන්ගේ පාලන සමයේ අධ්‍යාපනය සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.

A - ස්වදේශ භාෂාවන්ගෙන් අධ්‍යාපනය දෙන ලදී.

B - ඉගැන්වීම පිණිස ස්වදේශිකයන් ගුරුවරුන් ලෙස පුහුණු කරන ලදී.

C - පාසල් පරිපාලන ක්‍රමයක් හඳුන්වා දෙන ලදී.

D - අධ්‍යාපනය සඳහා දේවස්ථාන අසල වේදිකා ගොඩනගා නාට්‍ය නාඩගම් ආදිය පෙන්වන ලදී.

E - පිරිමි ළමුන්ට පමණක් අධ්‍යාපනය අනිවාර්ය කරන ලදී.

ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශ වන්නේ,

(1) A, B හා C ය. (2) A, B හා D ය. (3) B, C හා D ය.

(4) B, C හා E ය. (5) C, D හා E ය.

* * *

# (49) ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය

**II පත්‍රය**

* සැලකිය යුතුයි :

* I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**I කොටස**

**1. (i)** ක්‍රිස්තු වර්ෂ පළමු ශත වර්ෂයේ පලස්තීනයේ රෝමානු පරිපාලනය පිළිබඳ කරුණු හතරක් ලියන්න.

**(ii)** හෙරොද් රජුගේ පාලනයේ ලක්ෂණ පිළිබඳව කරුණු හතරක් ලියන්න.

**(iii)** ජුදා නායක පූජකවරුන් පිළිබඳව කරුණු හතරක් ලියන්න.

**(iv)** ජුදා මන්ත්‍රණ සභාව පිළිබඳ කරුණු හතරක් ලියන්න.

**(v)** පුරාණ පලස්තීනයේ ග්‍රීක පාලනය පිළිබඳ කරුණු හතරක් ලියන්න. (ලකුණු 5x4 =20යි.)

**2. (i)** මිලාන් ආඥාවේ ප්‍රතිඵලයක් ලෙස ක්‍රිස්තියානීන්ට අත්වූ යහපත පිළිබඳ කරුණු හතරක් සඳහන් කරන්න.

**(ii)** යුරෝපීය ගෝත්‍රයන් වෙනුවෙන් බෙනඩික්‍ටාන තාපසවරුන් ගෙන් සිදුවූ සේවාවන් හතරක් සඳහන් කරන්න.

**(iii)** මධ්‍යතන යුගයේ යුරෝපයේ සභාව තුළ සිදුවූ අක්‍රමිකතා හතරක් සඳහන් කරන්න.

**(iv)** කුරුසයේ ශුද්ධ වූ ජුවාම්තුමන් විසින් අධ්‍යාත්මිකත්වය පිළිබඳව ලියූ ග්‍රන්ථ හතරක නම් සඳහන් කරන්න.

**(v)** කුරුස යුද්ධ වලින් අත්වූ අයහපත් ප්‍රතිඵල හතරක් සඳහන් කරන්න. (ලකුණු 5x4 =20යි.)

**3. (i)** ප්‍රොතෙස්තන්ත්‍ර ප්‍රතිසංස්කරණය ඇති වීමට බලපෑ හේතු හතරක් සඳහන් කරන්න.

**(ii)** මාටින් ලූතර්තුමන්ගේ ඉගැන්වීම් හතරක් සඳහන් කරන්න.

**(iii)** ප්‍රොතෙස්තන්ත්‍ර ප්‍රතිසංස්කරණයේ ප්‍රතිඵලයක් ලෙස සභාව තුළ සිදුවූ වෙනස්කම් හතරක් සඳහන් කරන්න.

**(iv)** ත්‍රිදෙන්තියානු මන්ත්‍රණ සභාව මඟින් ගත් තීරණ හතරක් සඳහන් කරන්න.

**(v)** ප්‍රොතෙස්තන්ත්‍ර ප්‍රතිසංස්කරණයෙන් පසුව කතෝලික සභාව තුළ බිහි වූ ඕනෑම පැවිදි පන්ති හතරක නම් ලියන්න. (ලකුණු 5x4 =20යි.)

## II කොටස

**4. (i)** ග්‍රීක-රෝම ශිෂ්ටාචාරයේ විශේෂ ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 10යි.)

**(ii)** බහු වාර්ගික සහ බහු ආගමික ජාතියක් වශයෙන් ශ්‍රී ලංකාව තුළ සමගිය ඇති කිරීමට ග්‍රීක රෝම ශිෂ්ටාචාරයෙන් උගත ගත හැකි පාඩම් විස්තර කරන්න. (ලකුණු 10යි.)

**5. (i)** ''කන්ද'' උඩ දේශනය පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 10යි.)

**(ii)** සාධාරණ සමාජයක් ගොඩනැගීම සඳහා කන්ද උඩ දේශනය මඟින් ඉගැන්වූ වටිනාකම්වල ඇති ප්‍රයෝජනවත් බව පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 10යි.)

**6. (i)** ක්‍රිස්තියානි යුගයේ පළමු ශතවර්ෂය තුළ ක්‍රිස්තියානීන් මුහුණ පෑ අභියෝග නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)

**(ii)** සුවිශේෂී වටිනාකම්වල සැබෑ සාක්ෂිකරුවන්වීමේ දී ක්‍රිස්තියානීන්ට මුහුණ පෑමට සිදුවන අභියෝග නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 10යි.)

**7. (i)** ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සඳහා දායක වූ කිතුනු නායකයන් දෙදෙනෙකු පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 10යි.)

**(ii)** ශ්‍රී ලංකාවේ ද්විතීය අධ්‍යාපනය වැඩි දියුණු කිරීමෙහි ලා සභාවට දායක විය හැකි ආකාරය පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 10යි.)

**8. (i)** ක්‍රිස්තියානි කලාවේ උන්නතිය සඳහා මයිකල් ආන්ජලෝ සහ ලියනාඩෝ ඩාවින්චි යන දෙදෙනාගෙන් සිදු වූ මූලික සේවාවන් පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)

**(ii)** පාසල් වල ක්‍රිස්තියානි අධ්‍යාපනය වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් නාට්‍ය, චිත්‍ර, සංගීතය, නූතන ජන මාධ්‍ය වැනි කලා මාධ්‍ය යොදා ගැනීමේ ඇති සඵලත්වය පිළිබඳ රචනයක් ලියන්න. (ලකුණු 10යි.)

* * *